# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1985 අංක 37 දරන පොකුණුගල පුරාණ විහාර සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1985 සැප්තැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1985 සැප්තැම්බර් මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව ශත 60 යි.

# 1985 අංක 37 දරන පොකුණුගල පුරාණ විහාර සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1985 සැප්තැම්බර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 54/84.

**පොකුණුගල පුරාණ විහාර සංවර්ධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"පොකුණුගල පුරාණ විහාර සංවර්ධන සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සමිතියක්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ මොනරාගල පිහිටුවා තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු එකී සමිතිය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1985 අංක 37 දරන පොකුණුගල පුරාණ විහාර සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පොකුණුගල පුරාණ විහාර සංවර්ධන සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන්, "පොකුණුගල පුරාණ විහාර සංවර්ධන සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. **පොකුණුගල පුරාණ විහාර සංවර්ධන සමිතිය සංස්ථාගත කිරීම.**

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක්, දාගැබක් සහ විහාරස්ථානයට අවශ්‍ය වෙනත් ගොඩනැගිලි ඉදිකොට නඩත්තු කරගෙන යාම ;

(ආ) සාමාන්‍යයෙන් ප්‍රදේශවාසී ජනතාව තුළ සහ විශේෂයෙන් බෞද්ධ ජනතාව තුළ ශාසනික ප්‍රබෝධය ඇති වන සේ කටයුතු පවත්වාගෙන යාම ; සහ

ඒ 0779,79—6700 (84/08)

(ඈ) සාමාජිකයන්ගේ අධ්‍යාත්මික, සංස්කෘතික, සාමාජික හා ශාරීරික ශුභ සාධන සේවා ප්‍රවර්ධනය කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේද එකතු කිරීමේද, සංස්ථාවේ අරමුදල් ආයෝජන කිරීමේ ද සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය සේවක පිරිස සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ නිලධාරීන්ගෙන් සහ සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සෙසු තැනැත්තන් ගෙන් සමන්විත විධායක කාරක සභාවක් විසින් ඒ රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී සමිතියේ විධායක කාරක සභාවේ නිල දරන සාමාජිකයන්, සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව විය යුතු ය.

භාරකාර මණ්ඩලය.

6. (1) සංස්ථාවේ සියලු නිශ්චල දේපළවල භාරකාරත්වය සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වූ භාරකාර මණ්ඩලයක් වෙත, සංස්ථාවේ රීතිවලට අනුකූලව, පවරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී නිල දරන, සමිතියේ භාරකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

7. (1) සාමාජිකයන් ඇතුළත් කරගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම සඳහා ද, නිලධරයන්, විධායක කාරක සභාව සහ භාරකාර මණ්ඩලය තෝරා පත් කර ගැනීම සඳහා ද, නිලධරයන්ගේ, විධායක කාරක සභාවේ, භාරකාර මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයින්ගේ හා සේවක යන්ගේ යුතුකම් ඉටුකිරීම සම්බන්ධයෙන් සහ සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද, සංස්ථාව විසින්, කලින් කල සාමාජික යන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ

පනතේ විධිවිධාන වලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් එම රීති වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි වන්නේය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

*සමිතියෙන් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය.*

**8.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙහි දී පවතින සමිතියේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර සමිතියට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සහභාගි මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

*සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.*

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.*

**10.** සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී තැනැත්තන් විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

*ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයක දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.